UNIVERSITY HOSPITAL
General Sir John Kotelawala Defence University

**විශ්වවිද්‍යාල රෝහල**
**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය**

# පුරප්පාඩු

**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල වෙත සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ**
**(පූර්ණ කාලීන ස්ථිර පදනම මත)**

## 1. විශේෂඥ වෛද්‍ය නිලධාරි

- විශේෂඥ වෛද්‍ය නිලධාරි චර්ම රෝග
- විශේෂඥ වෛද්‍ය නිලධාරි විකිරණ
- විශේෂඥ ශල්‍ය වෛද්‍ය නිලධාරි හෘද සැත්කම්
- විශේෂඥ වෛද්‍ය නිලධාරි රක්තවේද
- විශේෂඥ වෛද්‍ය නිලධාරි වාහිනික වෘක්කවේදී

**සුදුසුකම්:**

I. 2018 අංක 28 දරන වෛද්‍ය (සංශෝධන) පනතට අනුව ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි/ ලියාපදිංචි විය හැකි වෛද්‍ය නිලධාරියෙකු හෝ දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු විය යුතුය.

හෝ

II. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය සහිත වෛද්‍ය නිලධාරියෙකු හෝ දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු වීම.

සහ

III. විශේෂඥ වෛද්‍ය (MD / MS) උපාධිය සමග කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මාණ්ඩලික සහතිකය (Board Certification) ලබා තිබීම. (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් 2014.10.11 දින නිකුත් කරන ලද 1883/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ I වන ඇමුණුම).

සහ

IV. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද “Certificate of Good Standing” ලබා තිබීම.

**වැටුප් පරිමාණය:**

MC 1-2 රු.(91,645 - 12 × 2,700 - 124,045)

* විශේෂඥ වෛද්‍ය නිලධාරි MC 1-2 පියවර 01 හි තබනු ලැබේ. - රු. 91,645.00

**පොදු කොන්දේසි:**

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

2. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල තුළ හෝ විශ්වවිද්‍යාල පරිපාලනය මගින් තීරණය කරනු ලබන දිවයිනේ ඕනෑම ස්ථානයක හෝ සේවය කිරීමටත් තනතුරේ රාජකාරි මැනවින් ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

3. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

4. අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනය වන විට අයදුම්කරුවන් සියලු සුදුසුකම් සම්පූර්ණ කොට තිබිය යුතුය.

5. විශේෂඥ වෛද්‍යවරුන් වෛද්‍ය සහ සම සෞඛ්‍ය විද්‍යාපීඨ සිසුන්ගේ ඉගැන්වීම් කටයුතු වලටද දායක විය යුතු අතර, මෙම කාර්යය වෛද්‍ය හා සම සෞඛ්‍ය විද්‍යා පීඨවල පීඨාධිපතිවරුන්ගේ සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මඟ පෙන්වීම යටතේ සිදුකළ යුතුය.

6. මෙම තනතුර ස්ථිර වන අතර, රාජ්‍ය සේවයෙහි රැකියාවක නියුතුව සිටි නිලධාරීන් වසර එකක (01) පරිවාස කාලයකට යටත් වේ.

7. සේවක අර්ථසාධක අරමුදල සඳහා ඔබගෙන් 10% දායකත්වයක්ද විශ්වවිද්‍යාලයෙන් 15% දායකත්වයක්ද දරන අතර සේවක භාරකාර අරමුදල සඳහා විශ්වවිද්‍යාලයෙන් 3% දායකත්වයක් දරනු ලැබේ. (පාර්ලිමේන්තුව විසින් නීතියෙන් නියම කරනු ලැබිය හැකි සංශෝධන වලට යටත්ව)

8. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමගින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතික වල ඡායා පිටපත් ලියාපදිංචි තැපැලෙන් 2023.05.29 දිනට හෝ ඊට පෙර “විධායක අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, වේරහැර” යන ලිපිනයට යොමු කළ යුතු අතර, ලියුම්කවරයේ ඉහළ වම් කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

9. අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල සතුවේ.

10. අසම්පූර්ණ, ප්‍රමාද වී යොමු කරනු ලබන සහ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල් ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. අයදුම්පත්‍ර භාගත කර ගැනීමට සහ වැඩි විස්තර සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිසෙන්න. www.kdu.ac.lk / දුරකථන අංකය – 0112044555.